**2019 අප්‍රියෙල් මස 22 වන දින සිට 2019 අප්‍රියෙල් මස 28 වන දින දක්වා**
**ප්‍රශංසා එකතු සුපුවත**

**ඔබට සාමය වේවා !** (ශු.ජොහාන් 20:21)

01. හැඳින්වීම : (2කොරෙන්ති 5:17) **"පැරණි දේ පහව ගොස් ඇත. සියල්ල අළුත් වී ඇත."**

* ක්‍රිස්තු උත්ථාන මංගල මහෝත්සවයත් සමගම ... පැරණි දේ පහව ගොස් දැන් සියල්ල අළුත් වී තිබේ. අපි සියල්ලෝම නවතාවයකට පත් වී ඇත. එබැවින් ශු.පාවුළු තුමා කියා ඇති පරිදි පැරණි මුහුන් ඉවත් කර නුමුහුන් පිටි පිඬක් වෙමු.
* කිතුනු ඇදහිල්ල යනු අප නොදකින දේ අදහා ගැනීමයි. එහි ප්‍රතිඵලය වන්නේ, එවිට අප විශ්වාස කරන දේ දැකීමයි. ක්‍රිස්තියානි විශ්වාසය අපට කුමක් පවසයිද? විශ්වාස කරන්න. එවිට ඔබ දකිනු ඇත. උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ දැන් අප අතර ය. අප මොහොතක් දෙනෙත් වසා ගෙන ඔවුන් වහන්සේ ජීවමාන වැඩ සිටීම අත්දකිමින් ඔබද / මමද මුළු මිනිස් සංහතියම එතෙර කල සමිඳාණන් වහන්සේට අපගේ ස්තුතිය, ප්‍රශංසාව පුද කරමින්, ඔවුන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියාව ප්‍රකාශ කරමු.
* " ඔබට සාමය වේවා !" ක්‍රිස්තුන් වහන්සේගේ ආදරයේ වචන ස්වල්පය අයිති කර ගනිමු.
* පුබුදු ගී 85 "එකම ලෙයක නෑකමක බැඳීලා...."

02. චතාරික භාවනාව පිළිබඳ අත්දැකීම් බෙදා ගන්න.

* **"එවිට දෙවියන් වහන්සේ ආලෝකය වේවා"යි වදාළ සේක.** (උත්පත්ති 1: 3)
* පසුගිය චතාරික සමයේ දින 40 තුළ අපි ඉහත තේමාව මුල් කරගෙන චතාරික භාවනාව කළෙමු. (පෞද්ගලිකවත්, පවුලක් හෝ පිරිසක් හැටියට) අපගේ මූලික අරමුණ වූයේ අප සිටින තැන සිට සිටිය යුතු තැනට එම ප්‍රසාද ජනක කාලය වරප්‍රසාද අධික කාලය තුළ ක්‍රිස්තුන් වහන්සේ සමඟ එතෙර වීමයි.
* විශේෂයෙන් ඔබගේ එතෙර වීමේ අත්දැකීම පළමුව බෙදා ගන්න. සැබවින්ම මනස්ස්ථාපනයේ පැතිකඩක් ලෙස ඔබ සිතන ආකාරය, සිතන විදිය වෙනස් කර ගන්න හැකිවීද?
* දෙවියන් වහන්සේගේ පරිපාලනය හා කළමණාකරණය අපගේ ජීවිත වලට අයිති කර ගැනීමට ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය තුළ තිබූ ප්‍රතිපත්තීන් පිළිබඳව අවධානය යොමු වෙලාද යන්න බෙදා ගන්න.

03. සුපුවත: ඔබට සාමය වේවා ! (ශු.ජොහාන් 20:21)

(අ) * ශුද්ධවූ සතිය තුළ එනම් දුක්බෝත්සව ඉරුදින සිට කුරුසිය මත දිවි පිදීමේ මොහොත දක්වා ක්‍රිස්තුන් වහන්සේ පැවසූ වදන් , මුහුණ දුන් අත්දැකීම් මෙනෙහි කර බැලීමේදී ඒ සියල්ලම පුදුමාකාරය.

* ජුදස්ගේ පාවාදීම, ශ්‍රාවකයන් ජෙත්සෙමනි උයනේදී පැන යාම, මම නොහඳුනමි යි ජේදුරු තුමන්ගේ වචන, මේ සියල්ලටම ක්‍රිස්තුන් වහන්සේ මුහුණ දුන් අයුරු මෙනෙහි කරමින් මොහොතක් බෙදා ගන්න.

(ආ) ශුද්ධ ලියවිලි පාඨ
i ශු.ජොහාන් 18:2-6 ද්‍රෝහියා වූ ජුදස්.....
ii ශු.ජොහාන් 18:25-27 සීමොන් ජේදුරු ගිනි තපමින් සිටියේය...

04 වචනයේ සේවකයා සඳහා : (ශු.ජොහාන් 20:19-20)

* ශු.සතියේ සිදුවූ අත්දැකීම ගැන මෙනෙහි කරද්දී සියල්ලෝ ඔවුන් වහන්සේ අත්හැර ගියද ජේසුස් වහන්සේ තුළ ඔවුන් කෙරෙහි තිබූ ප්‍රේමය වෙනස් නොවීය. මරණයෙන් උත්ථාන වූ සවස ඔවුන් වහන්සේ ඔවුන් සොයා පැමිණි සේක. ඔවුන්ට ප්‍රේමය ප්‍රකාශ කරමින් ඔවුන්ට සමාව දුන් සේක. ඔවුන්ගේ සිත් ආලෝකමත් කරමින්, ප්‍රීතිය භුක්ති විඳින්නට සැලසූ සේක.

05. ප්‍රායෝගික වීම සඳහා:

* ඔබගේද මගේද ප්‍රේමය අවංක විය යුතුය. ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහිද, මනුෂ්‍යයා කෙරෙහිද අවංක ප්‍රේමයකින් ප්‍රේම කරමු.
* අපව පාවා දෙන, ප්‍රතික්ෂේප කරන, විවිධ අකටයුතුකම් කරන, විරුද්ධවාදීන් ලෙස අපගේ ජීවිතවලින් බැහැර කර සිටින පුද්ගලයන් වෙනුවෙන් අයදිමු. සමාව දානය කරමු. ඔවුන් සමඟ එකමුතු වෙමු.
* අන් අය පිළිබඳව අප සිතන විදිය වෙනස් කර ගනිමු.
* ඒ සඳහා ශුද්ධාත්ම බලය පතා අපි යාච්ඤා කරමු. ක්‍රිස්තුන් වහන්සේ අපට දානය කළ සමාව දීමේ ප්‍රේමයෙන් සන්නද්ධ වෙමු.
* "ඔබට සාමය වේවා" අයිති කර ගනිමු. අන් අයටද එසේ ප්‍රාර්ථනා කරමු.

පුබුදු ගී අංක 124 "සාමයේ ප්‍රීතියේ...."

========================

## 2019 අප්‍රියෙල් මස 29 වන දින සිට 2019 අප්‍රියෙල් මැයි මස 04 වන දින දක්වා ප්‍රශංසා එකතු සුපුවත

**"එහෙත් ධෛර්යවත් වන්න; මම ලෝකය අභිබවා ජය ගතිමි"** (ශු.ජොහාන් 16:33)

01. ප්‍රශංසාව සඳහා : (ශු.ජොහාන් 20:22) "ශුද්ධාත්මයාණන් පිළිගන්න"

* ක්‍රිස්තුන් වහන්සේ මනුෂ්‍ය ආකාරයෙන් වැඩ සිටි සමයේදී නොයෙක් ආකාරයෙන් දුක් වේදනා විඳින්නට ඔවුන් වහන්සේට සිදු විය. ලෝකයේ දුක් ගැහැට විඳින්නට ඔවුන් වහන්සේට සිදු වුවා පමණක් නොව, ඔවුන් වහන්සේ පියාණන් වහන්සේගේ ආදරය තුළ සියල්ලට ප්‍රේමණීයව, ඉත සිතින් දරා ගෙන සියල්ල ජය ගත් සේක.
* ශුද්ධාත්මයාණන් පිළිගන්න; ධෛර්යවත් වන්නැයි සමිඳාණෝ අපව අළුත් ජීවිත පැවැත්මකට කැඳවන සේක. අපි ඔවුන් වහන්සේගේ ජීවිත අත්දැකීම දෙස බලමු. ධෛර්යවත් වෙමු. මන්ද ඔවුන් වහන්සේ අප තනි වෙන්නට ඉඩ නොහැරිය සේක. ශුද්ධාත්මයාණන් වහන්සේව අපට තෑගි කළසේක.
* ඔවුන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියා මුල් කරගෙන හද පත්ලෙන්ම අපගේ ස්තුති ප්‍රශංසාව පුද කරමු.
* පුබුදු ගී අංක 19 "අප ජීවනයද ඔබ වේ..."

02. පසුගිය සතියේ සුපුවත තුළින් එකිනෙකාට සිතින්, වචනයෙන් සමාව පැතීමට පමණක් නොව, ක්‍රිස්තුන් වහන්සේ තුළ සමාව බෙදා ගනිමින් සමගි වෙන්නටත්, එකමුතු වෙන්නටත් ප්‍රායෝගික වශයෙන් පියවර ගැනීමටත් තීරණය කළෙමු. ඒ පිළිබඳව ඔබගේ අත්දැකීම බෙදා ගන්න.

03. සුපුවත : "එහෙත් ධෛර්ය වන්න; මම ලෝකය අභිබවා ජය ගතිමි" (ශු.ජොහාන් 16:33)

* ශු.ජොහාන් 20:24-25 **"...... උන්වහන්සේගේ ඇලයෙහි මාගේ අත් දමා බැලුවොත් මිස නැත්නම් විශ්වාස නොකරමි"යි කීය.**
* ඉහත සඳහන් ප්‍රකාශනය සමග අවුරුදු 3ක පමණ කාලයක් ක්‍රිස්තුන් වහන්සේව සමීපව ඇසුරු කල මෙම ශ්‍රාවකයා එසේ ප්‍රකාශ කරන්න ඇත්තේ මන්දැයි යන්න ඔබ අතර බෙදා ගන්න.

04. වචනයේ සේවකයා සඳහා :

(අ) * සමහර විට ක්‍රිස්තුන් වහන්සේ ඒ ආකාරයෙන් දුක් විඳීම, අසරණ වීම, දුබලයෙකු වීම මෙන්ම කුරුසියේ මරණයට භාජනය වූ සැටි ඔහුට දරා ගත නොහැකි වෙන්නට ඇති.

* මෙපමණ ප්‍රාතිහාර්ය කළ, ප්‍රේම කළ ........ මහා දිව්‍යවරයෙකු සේ දෙව් වදන් දේශනා කල අපේ ගුරු දේවයාණන්ට මෙවැනි නීච නින්දිත තත්ත්වයකට පත් වූයේ මන්ද? ඔහු තුළ තිබූ බලාපොරොත්තු කඩවීම, බිඳ වැටීම නිසා අධිකතර ශෝකයක්, දරාගත නොහැකි තත්ත්වයක් ඔහු තුළ ඇති වූවා විය හැකියි.
* එම නිසාම ඔහු සමහර විට ශ්‍රාවක සංඝයෙන් ඈත් වී හුදකලා වූවා විය හැකියි. එම නිසා ඔහු අධෛර්යවත් වුනාද? ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි තිබූ විශ්වාසය දුර්වල කර ගත්තද?

(ආ) තෝමස් අපෝස්තුළුවරයා මෙන් අපිදු විශ්වාසය හීනවූ අවස්ථාවලදී සිතපු ආකාරය, තීරණ ගත් ආකාරය, හැසිරුනු, ක්‍රියා කල අයුරු අවංකව බෙදා ගනිමු.

05. ප්‍රායෝගික ජීවිතය සඳහා පියවර කිහිපයක් :

* අපි විශ්වාසයට, ප්‍රේමයට පටහැනි වෙමින් "මා අනුව එන්න" කැඳවීම ඉදිරියේ දුබලවූ අවස්ථාවන් සිහිකර ගනිමින් ක්‍රිස්තුන් වහන්සේගෙන් සමාව අයදිමු. මනස්ථාපනය වෙමු.
* ත්‍රිවිධ සතුරන්ගෙන් මෙන්ම, විවිධ පුද්ගලයන්ගෙන්, සමාජයෙන් එල්ල වන තාඩන පීඩන හමුවේ ශුද්ධාත්මයාණන්ට අවදි වෙමින් ඊට නිසි පිළිතුරු දැක්වීම සඳහා අවදි වෙමු.
* අපගේ බලාපොරොත්තු ඒ ආකාරයෙන් ඉටු නොවීම නිසා, අප සිතන - පතන අයුරින් අපට සරිලන ආකාරයෙන් පිළිතුරු නොලැබෙන විටදී අපගේ ඇදහිල්ල තුළ ස්ථීර වෙමින් ප්‍රශංසා කරන ජීවිත පැවැත්මකට ඇතුළු වෙමු.

06. පාස්කු අභිරහස අපගේ ජීවිත ගමනට සවිය බැවින්, මේ ශුද්ධවූ අභිරහස මත ජීවිතය ගොඩනගා ගනිමු.

07. අපි යාච්ඤා කරමු.

* සිතට, මිනිස් බුද්ධියට දැනෙන, හසුවෙන මායිමෙන් ඔබ්බට යන්නට අවශ්‍ය ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය පතා....
* ගෝලයන් ටික දෙනා සිතුවා සේ එදා ජුදා මන්ත්‍රණ සභාව අපව කොයි වෙලේ අත් අඩංගුවට ගෙන මරා දමයිද යන ආකල්පයෙන් බියෙන් මිදුනා සේ ක්‍රිස්තුන් වහන්සේගේ හඬට සවන් දෙමු.

**එහෙත් ධෛර්යවත් වන්න; මම ලෝකය අභිබවා ජය ගතිමි... ශුද්ධාත්මයාණන් පිළිගන්න**

* ගීය - "වඩින්න වඩින්න ශුද්ධාත්මයාණෙනි...." පුබුදු ගී අංක 317(නව), 330(පැරණි)